**නැගෙනහිර පළමුවන පළාත් සභාවෙ පළමුවන සැසි වාරය ආරම්භ කරමින් නැගෙනහිර පළාතේ ගරු ආණ්ඩුකාරවර මොහාන් විජේවික්‍රම මැතිතුමාගේ කථාව 2008 ජුනි මස 11 වන දින**

ගරු සභාපතිතුමනි
ගරු ප්‍රධාන අමාත්‍යතුමනි
ගරු අමාත්‍යවරුනි
ගරු පළාත් සභා සභික මහතුනි/ මහත්මියනි
ආරාධිත අමුත්තනි
නෝනාවරුනි, මහත්වරුනි

නැගෙනහිර පළාත් සභාවෙ පළමුවන සැසිවාරය ආරම්භ කරමින් එහි සමාරම්භක දේශනය පැවැත්වීමට ලද මෙම අවස්ථාව මා ලද භාග්‍යක් කොට සලකමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සහ එතුමාගේ රජය වෙනුවෙන් අද මෙම සභාවට පළාතේ නොයෙක් ප්‍රදේශ නියෝජනය කරමින් තෝරා පත් කරගත් විවිධ දේශපාලන පක්ෂ වලට අයත් පළාත් සභා සභිකවරුන්ට මාගේ සුභාශිංසනය පළමුවෙන්ම පිරිනමමි.

අද දින නැගෙනහිර පළාතේ ජනතාවට ඓතිහාසික මෙන්ම අතිශයින්ම වැදගත් දිනයකි. එසේම නැගෙනහිර පළාත් සභාවේ පළමුවන සැසිවාරය ආරම්භ කරන මෙම අවස්ථාව ශ්‍රී ලංකා දේශපාලන ඉතිහාසයේ වැදගත් මං සළකුණක් සනිටුහන් කරන අවස්ථාවකි.

1991 වසරේ සිට පුරා වසර 17 ක කාළයක් මෙම ප්‍රදේශයේ පැවැති ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් පැවැති කිසිදු රජයකට නැගෙනහිර පළාතේ ජනතාවට පළාත් සභාවක් පිහිටුවා ගැනීමට අවස්ථාවක් සලසා දීමට නොහැකි විය.

ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා 2005 නොවැම්බර් මස අතිගරු ජනාධිපතිවරයා ලෙස පත්කර ගැනීමෙන් අනතුරුව උතුරු නැගෙනහිර ජනතාවට සාමය උදාකරදීම සඳහා එල්ටීටීර් ත්‍රස්තවාදීන් සමඟ සාමකාමී එකඟතාවයකට පැමිණිම අරමුණු කර සාකච්ජා වට කීපයක් පැවැත්වීමට කටයුතු කරන ලදි. එනමුත් අතිගරු ජනාධිපතිතුමා පදවි ප්‍රාප්ත වී මාස තුනක පමණ කාළයකදී LTTE ත්‍රස්තවාදීන් විසින් හමුදා සෙබලුන් ප්‍රවාහනය කළ වාහන කීපයක්

සහනාවික යාත්‍රා කීපයක්ම පුපුරුවා දැමීමට කටයුතු කරන ලදි. එමෙන්ම යුධ හමුදාපතිවරයා ඝාතනය කිරීමට තැත්කළ අවස්ථාවේ පවා රජය සාමකාමී විසඳුමකට එළැඹීම සඳහා සාකච්ඡා ඉදිරියටම ගෙන යන ලදි.

නමුත් රුදුරු ත්‍රස්තවාදීන් මාවිල්ආරු අමුණ වසාදමා සේරුවිල අහිංසක ගොවියන් පීඩාවට පත්කිරීමෙන් අනතුරුව ආරක්ෂක හමුදා විසින් අහිංසක ගොවි ජනතාව එම පීඩාවෙන් මුදවා ගැනීමට උත්සාහ කළ අවස්ථාවේදී ත්‍රස්තවාදීන් විසින් මුතූර් ප්‍රදේශයේ අහිංසක මුස්ලිම් ජනතාව සිය ගම් බිම් වලින් පලවා හරින ලදි. කන්තලේ සහ කින්නියා ප්‍රදේශවලට සංක්‍රමණය වූ මුස්ලිම් සරණාගතයින් කඩිනමින් නැවත පදිංචි කිරීමේ ඇති අවශ්‍යතාවය නිසා අතිගරු ජනාධිපතිතුමා විසින් නායකත්වය දෙමින් එල්ටීටීඊ ත්‍රස්තවාදීන් මෙම ප්‍රදේශයෙන් පලවා හැර ජනතාවට නැවත ජීවත් වීමට හැකි පරිසරයක් නිර්මාණය කිරීමට ආරක්ෂක හමුදාවන්ට නියෝග කරන ලදි.

අතිගරු ජනාධිපතිතුමාගේ උදාර නායකත්වය යටතේ අප වීරෝදාර රණවිරුවන් සහ පොලිසිය විසින් මනා සම්බන්ධීකරණයක් ඇතිව නැගෙනහිර මුදවා ගැනීමේ ක්‍රියාන්විතය දියත් කර ජනතාව ත්‍රස්තවාදී ග්‍රහණයෙන් මුදවා ගත් බව මා මේ අවස්ථාවේ ඉතා සතුටින් ප්‍රකාශ කරමි. දීර්ඝ කාලයක් තිස්සේ නොසලකා හැර තිබූ නැගෙනහිර ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ මහින්ද චින්තනයෙන් බිහිවුණු **"නැගෙනහිර නවෝදය"** යන සංකල්පය **නැගෙනහිර** ජනතාවට යථාර්ථයක් බවට පත්කර ගත හැකි වුයේ ත්‍රස්තවාදී ග්‍රහණයෙන් නැගෙනහිර පළාත සම්පූර්ණයෙන්ම මුදවා ගැනීමෙන් පසුවය.

එම නිසා මා මේ අවස්ථාවේදී නැගෙනහිර මුදවා මෙහි ජනතාවගේ නිදහස හා ඔවුන්ගේ එදිනෙදා කටයුතු බියෙන් සැකයෙන් තොරව ඉටුකර ගැනීමට අවස්ථාව සලසා දීම සඳහා සිය ජීවිත පූජා කළ, ආබාධිත වූ ආරක්ෂක හමුදා සහ පොලිසියේ සියළු රණවිරුවන්ට මාගේ ප්‍රණාමය පුද කර සිටිමි.

එසේම නැගෙනහිර ජනතාවට වසර 17 කට පසුව ප්‍රදේශයේ තත්ත්වය සාමාන්‍ය අතට පත්කර පළාත් සභාවට ඔවුන්ට කැමති පාලකයින් ස්වාධීනව තෝරාපත්කර ගැනීමට අතිගරු ජනාධිපතිතුමා ලබාදුන් මෙම අවස්ථාව ඔවුන් ඉතා අගය කරනු ලබන බව සිහිපත් කරමි.

**භූගෝලීය තොරතුරු**

නැගෙනහිර පළාත ශ්‍රී ලංකාවෙ නැගෙනහිර වෙරළබඩ තීරයේ පිහිටා ඇති

අතර එය නැගෙනහිරට බෙංගාල බොක්කද, උතුරට උතුරු පළාත් සීමාවද, බටහිරට, උතුරු මැද සහ මධ්‍යම පළාත් සීමාවද, දකුණට ඌව සහ දකුණ පළාත් සිමාවට ද සීමා වු වර්ග කිලෝමීටර් 9792 ක් වු භූමි භාගයකි. මින් වර්ග කිලෝමිටර් 390 ක ප්‍රමාණයක් අභ්‍යන්තර ජලාශ වලින් සමන්විතය. නැගෙනහිර පළාත ශ්‍රී ලංකාවෙ මුළු භූමි ප්‍රමාණයෙන් 16% කි. මෙම භූමිය දර්ශනිය දිගු වෙරළ තීරයකින්, අභ්‍යන්තර ජලාශ, මිශ්‍ර වනාන්තර හා කෘෂිකර්මාන්තයන්ට ඔබින සාරවත් භූමියකින් සමන්විත වන අතර, ජාත්‍යන්තර වටිනාකමක් ඇති ත්‍රිකුණාමලයේ පිහිටි ස්වාභාවික වරාය මෙම පළාත, අනිකුත් පළාත් වලට වඩා සුවිශේෂිභාවයක් එක් කිරිමට දායක වී ඇත. ත්‍රිකුණාමලය මෙම පළාතේ අගනුවර සේ පිළිගෙන ඇත.

**ජනගහනය**

2006 වර්ෂයේ දී නැගෙනහිර පළාතේ වෙසෙන මිලියන 1.6 ක් පමණ වු ජනගහනය, ශ්‍රී ලංකාවෙ ජනගහනයෙන් 8.21% ක් පමණ වෙ. සිංහල, දෙමළ, මුස්ලිම් යන ප්‍රධාන ජාතීන් සම සමව මෙම ප්‍රදේශයේ ජීවත් වන අතර, සැලකිය යුතු පිරිසක් පසුගිය සමයේ ත්‍රස්තවාදි හේතූන් මත වෙනත් පළාත් වලට සංක්‍රමණය වී ඇත. මෙම ජනතාවගෙන් සමහරක් නැවත තම ගම්බිම් කරා පැමිණෙමින් පවතී.

**ආර්ථික පසුබිම**

දළ දේශිය නිෂ්පාදනයට 14% ක දායකත්වයක් සැපයු මෙම පළාත පසුව ප්‍රදේශයේ ඇති වු අයහපත් වාතාවරණය මත 8% දක්වා පහත බසින ලදි. කෙසේ වෙතත් මේ වන විට උදා වී ඇති යහපත් වතාවරණයන් නිසා පසුගිය වසරේ ඇස්තමේන්තුවලට අනුව දළ දේශිය නිෂ්පාදනය 16% ක සීමාවට ලඟා වී ඇත. වර්තමානයේ පළාතේ ඒකපුද්ගල ආදායම රු: 2905/= ක් වන අතර දේශිය ඒක පුද්ගල ආදායම රු: 3968/= කි. එය නැගෙනහිර පළාතට වඩා 36.5 % ක ඉහල අගයක් පෙන්නුම් කෙරේ. කෘෂිකර්මාන්තය මෙම ප්‍රදේශයේ ප්‍රධාන නිෂ්පාදන කර්මාන්තය වන අතර, එය දේශීය දළ නිෂ්පාදනයෙන් 10.2 % ක් පමණ වෙ. මෙම ප්‍රදේශයේ දැනට ලැබී ඇති සාමකාමී වතාවරණය උඩ මෙම තත්ත්වය තවත් වැඩි දියුණු කිරීමට දැන් පියවර ගෙන ඇත.

**පරිපාලනය**

පළාත් සභාව මගින් සපයනු ලබන මහජන සේවාවන් සැලසීම සඳහා, පළාත් අමාත්‍යාංශ පහකින් සහ ඒ යටතේ දෙපාර්තමේන්තු 18 ඇත. ප්‍රධාන ලේකම් යටතේ ක්‍රියාත්මක වන ආයතන 16 කින් යුක්ත පරිපාලන සංවිධානයක් අප

සතුව ඇති අතර පළාත් රාජ්‍ය නිළධාරින් පත් කිරිම, මාරු කිරිම හා විනය කටයුතු ආණ්ඩුකාරවරයා විසින්, පළාත් රාජ්‍ය සේවා කොමිෂම මඟින් සිදු කරනු ලැබේ.

නැගෙනහිර පළාත ත්‍රිකුණාමලය, මඩකලපුව හා අම්පාර යන පරිපාලන දිස්ත්‍රික්ක තුනකින් සමන්විත වන අතර ඒ තුළ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 45 කි. සමස්ථ ග්‍රාම නිළධාරි කොට්ඨාශ 1087 කි. ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් අදාල දිස්ත්‍රික්කයේ මධ්‍යම රජයේ සහ පළාත් සභාවේ හඳුනාගත් සංවර්ධන කටයුතු මෙහෙයවනු ලැබේ. අදාල දිස්ත්‍රික් සම්බන්ධිකරණ කමිටුව ඒ ඒ දිස්ත්‍රික්කයන්හි සංවර්ධන හා පරිපාලන කටයුතු මෙහෙයවීමට විශාල පිටුවහලක් වී ඇත.

## නැගෙනහිර පළාත් සභාව ස්ථාපිත කිරීම

උතුරු නැගෙනහිර පළාතේ අවිගත් පිරිසක් විසින් ක්‍රියාත්මක කෙරෙණු ත්‍රස්තවාදි ක්‍රියා අවසන් කිරිම සඳහා මුලික දේශපාලන විසඳුමක් ලෙස හඳුන්වා දුන් පළාත් සභා ක්‍රමය මත බිහි වු උතුරු නැගෙනහිර පළාත් සභාව වසර 02 ක් වැනි කෙටි කාළයක් ක්‍රියාත්මක වීමෙන් පසුව 1991 වසරේදී විසුරුවා හරින ලදි. එනමුත් 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකුලව පිහිටුවන ලද අනිකුත් පළාත් සභා දිගින්දිගටම ක්‍රියාත්මක වෙමින් මේ වන විට මැතිවරණ 04 ක් පවත්වා තම කටයුතු ඉදිරියට ගෙන යමින් සිටි.

අතීතයේ සිටම ශිෂ්ඨ සම්පන්න ජිවන රටාවකට උරුමකම් කියන ශ්‍රි ලාංකිය ජනතාව සාමකාමීව නිදහස දිනාගත් දා සිටම මහා සංවිධානය වු ව්‍යවස්ථා පරිපාලන ක්‍රමයක් මගින් ජාතික පළාත් හා ප්‍රාදේශිය පාලනය සිදු කර ඇත. එහෙත් පසුව නිර්මානය වු උතුරු නැගෙනහිර ත්‍රස්තවාදි ක්‍රියා හේතුවෙන් ඇති වු අයහපත් වාතාවරණය මත වසර 17ක් පමණ මෙම පළාත් සභාව සඳහා මැතිවරණයක් පැවැත්වීමට නොහැකිවිම හේතුවෙන් අනෙකුත් පළාත් වලට සාපේක්ෂව මෙම පළාතේ ජනතාවට සංවර්ධනයේ එල නෙළා ගැනිමට නොහැකි විය. 2006 ඔක්තෝම්බර්16 වැනි දින ලබාදුන් ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවක් මත උතුරු සහ නැගෙනහිර වෙන් වෙන් පරිපාලන ඒකක වශයෙන් බෙදා වෙන් කරන ලද අතර, 2007 ජනවාරි මස පළමුවන දින සිට නැගෙනහිර පළාතට වෙනම ආණ්ඩුකාරවරයකු, කාර්යය මණ්ඩලය, සහ අවශ්‍ය යටිතල පහසුකම් සලසා ස්වාධීනව ක්‍රියාත්මක වීම ආරම්භ විය.

අපගේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයෙන් පරිපාලනය විමධ්‍යගත කිරීමේදි පළාත් සභා විසින් ව්‍යවස්ථාදායක විධායක සහ මුල්‍ය අධිකාරිය

ක්‍රියාත්මක කලයුතු ක්ෂේත්‍ර පැහැදිලිව දක්වා ඇත. එසේම පළාත් සභාවල සහ මධ්‍යම රජයේ වගකීම්, විෂය ක්ෂේත්‍රයන් වෙන් වෙන් වශයෙන් දක්වා ඇත. තවද පළාත් සභා සහ මධ්‍යම රජය එකඟතාවයකින් කටයුතු කලයුතු විෂයන් සමගාමී ලැයිස්තුවකට ඇතුලත් කොට ඇත.

පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක වී වසර 20 ක් පමණ කාලයක් ගත වුවත් බලය විමධ්‍යගත කිරිම සහ මධ්‍යම රජය ක්‍රියාත්මක කළ විෂයයන් පළාත් සභාවන්ට පවරා දීමේ ක්‍රියාවලියේ ව්‍යාකූලතාවයන් තවමත් දක්නට ඇත. මෙහිදී එවැනි කටයුතු පළාත් සභා සහ මධ්‍යම රජය මඟින් එකඟතාවයකින් විසඳාගත යුතුව ඇත.

නැගෙනහිර පළාත් සභාවට නියමිත පරිදි තෝරාගත් සභාවක් නොමැති වීම හේතුවෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව කළ හැකිව තිබූ ව්‍යවස්ථාපිත කටයුතු බොහෝමයක් ඉටු කිරීමට නොහැකිවිය. ඉන් එකක් නම් පළාත් සභාවේ ආදායම් තත්ත්වය ඉහළ දැමීමට අවශ්‍ය ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීමයි. පළාත් සභාවන්ට හුදකලාව තමන් වෙත පැවරුණු විෂයන්ට අදාල කටයුතු ඉටු කිරීමට හැකියාවක් නොමැත. මධ්‍යම රජය සහ පළාත් සභාව අන්‍යෝන්‍ය සහයෝගිත්වයෙන් වැඩසටහන් ක්‍රියාවට නැංවිය යුතුව ඇත.

නැගෙනහිර ජනතාව, ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා සහ සුනාමි ව්‍යසනය යන සෑම අංශයකින්ම පීඩා විඳ ඇති අතර එම හේතූන් සහ අතපසුවීමෙන් සංවර්ධන ක්‍රියාවලියෙන් බැහැර වූ ප්‍රදේශ සඳහා වැඩි අවධානයක් යොමු කිරීමට කාලය එළඹ ඇත.

### මහින්ද චින්තනය සහ නැගෙනහිර නවෝදය

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තනයෙන් මතුවන නැගෙනහිර නවෝදය වැඩසටහනේ අරමුණ ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් වූ සහ සංවර්ධන ක්‍රියාදාමයෙන් අතහැර දමා තිබූ නැගෙනහිර ප්‍රදේශයට නව උදාවක් ඇති කිරීමයි. මෙම ප්‍රදේශයට නව මාර්ග පද්ධති, වරාය පහසුකම්,ගුවන් තොටුපල, ජල සම්පාදනය, වාරිමාර්ග පහසුකම් සැලසීම සහ නව නාගරිකරණයක් ඇතිකරමින් මෙම ප්‍රදේශයට නව තාක්ෂණය, පුහුණුව සහ දැනුම ඇති කරවීම නැගෙනහිර නවෝදය වැඩසටහන මඟින් දැනටමත් කටයුතු කර ඇත.

එසේම නැගෙනහිර නවෝදය වැඩ සටහන මඟින් පළාතේ සියළුම ජනකොටස්වලට සමාන ප්‍රතිලාභ හිමිවන සංවර්ධන ක්‍රියාවලියක් දියත් කරනු ලබන අතර, මේ සඳහා ජනතාවගේ සහජ හැකියාවන් උපයෝගී කර ගනිමින්,

එම භෞතික සහ මානව සම්පත් සංවර්ධනය කරමින් එතුලින් දුප්පත්කම් අවම කරගනිමින් බස්නාහිර පළාතට ආසන්න සංවර්ධනයක් ඇති කිරීම ඉලක්ක කර ඇත.

**සාමය හා සහජීවනය සඳහා පියවර**

පසුගිය වසර කීපයේදී පැවති යුද්ධමය තත්ත්වය යටතේ අවතැන්වී තම සාමාන්‍ය ජීවනෝපාය අහිමි වී ඇති සහ ජීවන තත්ත්වය සම්පූර්ණයෙන්ම නැති වී ඇති පුද්ගලයන් සහ මෑතකදී අවතැන්වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම රජයේ මුඛ්‍ය පරමාර්ථය විය. ඉතා කෙටි කාලයක් තුලදී රජය විසින් නැගෙනහිර පළාතේ සියළු ප්‍රදේශවල ආරක්‍ෂාව තහවුරු කර සාමය සහ සහජීවනය නගා සිටුවීමට සුදුසු පරිසරයක් ගොඩ නගා ඇත. රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන දායක කරගනිමින් අවතැන් වූ පවුල් විශාල ප්‍රමාණයක් නැවත පදිංචිකර වීමටත් ස්වකීය ජීවනෝපාය මාර්ගයන් වැඩිදියුණු කිරීමටත් කටයුතු කර ඇත.

**මහාපරිමාණ සංවර්ධනය**

මෙම පළාතේ මහා පරිමාණ සංවර්ධන යෝජනාවලියක් ක්‍රියාත්මක කිරීමට රජය අදහස් කර ඇති අතර ඒ අනුව ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ආයෝජන අවස්ථා ප්‍රවර්ධනය කිරීමට පියවර ගෙන ඇත. ගල් අඟුරු බලාගාරයක් ඉදිකිරීම, කර්මාන්ත පුරයක් ඉදිකිරීම, නාගරික සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම, සංචාරක කලාපයක් ඇති කිරීම සහ මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම ඉන් සමහරකි.

**ප්‍රතිස්ථාපනය හා නැවත ඉදිකිරීම**

මෙම පළාතේ ප්‍රචණ්ඩත්වයෙන්, සුනාමි ව්‍යසනයෙන් විනාශයට පත් වූ ප්‍රදේශ සහ හිතාමතා හෝ අතපසුවීමෙන් සංවර්ධනයෙන් ගිලිහුණු ප්‍රදේශ නගා සිටුවීම සඳහා රජය විසින් විදේශ ආධාර සහ ණය පහසුකම් යටතේ පහත සඳහන් ව්‍යාපෘති ආරම්භකර ඇත.

උතුරු නැගෙනහිර ප්‍රජා ප්‍රතිස්ථාපන හා සංවර්ධන ව්‍යාපෘතිය (NECORD)
විපතටපත් ප්‍රදේශ පුනරුත්ථාපන ව්‍යාපෘතිය (CAARP)
උතුරු නැගෙනහිර වෙරළබඩ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය (NECCDEP)
දිළිඳු හිතකාමී නැගෙනහිර යටිතල ව්‍යාපෘතිය
දිළිඳු හිතකාමී ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය (PROP)
දිළිඳුකම පිටුදැකීමේ ආර්ථික වර්ධන හා සමාජ බලගැන්වීමේ ව්‍යාපෘති (PEACE)
යළි පිබිදීමේ ව්‍යාපෘතිය ( RE – AWAKENING)

උතුරු නැගෙනහිර නිවාස ප්‍රතිසංස්කරණ වැඩසටහන (NEHRP)

## කෘෂිකර්මාන්තය

නැගෙනහිර පළාතේ ප්‍රධාන ආර්ථිකය කෘෂිකර්මාන්තය වන අතර එය ජනගහනයෙන් 70% ක ගේ ප්‍රධාන ආදායම් මාර්ගයද වේ. ශ්‍රී ලංකාවේ ධාන්‍යාගාරය ලෙස විරුධාවලිය ලත් නැගෙනහිර පළාතේ වී නිෂ්පාදනය ජාතික නිෂ්පාදනයෙන් 24 % ක් වේ.

ප්‍රදේශයේ වගා කළ හැකි කුඹුරු ප්‍රමාණය හෙක්ටයාර් 1,74,335 කි. එහෙත් ප්‍රදේශයේ පැවති වතාවරණය මත 2006 වසරේදී වගා කරනු ලැබුවෙ ඉන් 53% ක ප්‍රමාණයකි. 2007 වසරේදී කෘෂිකර්මාන්තය නඟා සිටුවීමේ වැඩපිළිවෙල යටතේ අමතර හෙක්ටයාර් 17,975 ක් ද වගා කිරීමට හැකි විය. අපගේ අරමුණ වගා කළ හැකි කුඹුරු ප්‍රමාණයෙන් 80 % ක් දක්වා වගා කටයුතු සඳහා යොදවා ගැනීමයි. උසස් බිත්තර වී ලබා දෙමින් හා නව ගොවිපළ යන්ත්‍ර හඳුන්වා දෙමින් නිෂ්පාදන වියදම අඩු කිරීමට කටයුතු කර ඇති අතර, එමගින් වී නිෂ්පාදනය හෙක්ටයාර් 01කට මෙට්‍රික් ටොන් 4 සිට 5 දක්වා වැඩි කිරීමටද කටයුතු කර ඇත.

සත්ව ආහාර සඳහා ඉතා දැඩි ඉල්ලුමක් පැවති බඩඉරිඟු වගාව සඳහා අනගිත දෙමින් බඩඉරිඟු වගාව ව්‍යාප්ත කිරීමට ගත් පියවරද ඉතා වැදගත් කොට සැලකිය හැකිය. අවශ්‍ය බීජ සපයා දීමෙන් සහ වෙළඳපළ සකස්කර දීමෙන් 2006/2007 වර්ෂයේ දී හෙක්ටයාර් 8,100 ක්ව පැවති ඉරිඟු වගාව 2007/2008 වර්ෂයේ හෙක්ටයාර් 11,354 ක් දක්වා වැඩිකිරීමට හැක විය. ජාතික බඩඉරිඟු අවශ්‍යතාවයෙන් 25% ක දායකත්වයක් නැගෙනහිර පළාතෙන් ලබා දීමට අවශ්‍ය පියවර ඉදිරියේදී ගනු ඇත.

පළාතේ එළවළු අවශ්‍යතාවයෙන් 50%ක් පළාතේම නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කර ඇති අතර, වානිජ මට්ටමේ හා ගෙවතු වගා මට්ටමින්ද එළවළු නිෂ්පාදනය වැඩි කර ඇත. රජය මගින් ප්‍රකාශයට පත්කර **“ අපි වවමු රට නගමු”** තේමාව ඔස්සේ පසුගිය වර්ෂයේ ගෙවතු වගා 10,810 ක් ඇති කිරීමට කටයුතු කර ඇත. මේ යටතේ එළවළු බීජ මලු 10,000 ක් ගොවියන් වෙත නිකුත් කර ඇති අතර, හතු වගාව සහ මී මැස්සන් ඇති කිරීම දියුණු කිරීමට පියවර ගෙන ඇත.

## පශු සම්පත් සංවර්ධනය

නැගෙනහිර පළාත මහා පරිමාණ කිරි නිෂ්පාදන පළාත් වලින් එකක් වන අතර මෙහි ගව ගහනය රටේ ගව ගහනයෙන් 15%කි. ජාතික කිරි නිෂ්පාදනයෙන් 11%ක් පමණ මෙම පළාතේ නිෂ්පාදනය කෙරේ. රට අදාල ගොවි බිම් සහ ජලය ප්‍රමාණවත්ව ඇති අතර අවශ්‍ය පුහුණු සහ නුපුහුණු මානව සම්පත් මෙම පළාතේ බහුලව ඇත.

පසුගිය ආරක්ෂක වාතාවරණය මත සතුන් අවතැන් වීම සහ කිරි එකතු කිරීමේ ජාලය අඩපණ වීම මත කිරි නිෂ්පාදනයට බාධා පැමිණි අතර, පශු වෛද්‍ය නිළධාරීන් සහ පශු සම්පත් සංවර්ධන නිළධාරීන් අවශ්‍ය ප්‍රමාණයට නොමැතිකම පශු සම්පත් මෙම ප්‍රදේශයේ සංවර්ධනය කිරීමට ඇති ගැටලුවක් බව හැඳින ගෙන ඇත.

වර්තමානයේ නැගෙනහිර පළාතේ පශු වෛද්‍ය කාර්යාල 42 ස්ථාපිත වී ඇති අතර පශු සම්පත් සංවර්ධන නිළධාරීන් 22 ක් මෑතකදී බඳවාගත් අතර ඉදිරියේදී පශු වෛද්‍ය හිඟය මඟහැරවීමට කටයුතු කර ප්‍රාදේශීය සත්ව ගොවිපලවල් දියුණු කිරීමටද උප්පුවේලි සත්ව ගොවිපලේ එක් දිනක් වයසැති කුකුල් පැටවි නිෂ්පාදනය මසකට 4,000 සිට 12,000 දක්වා වැඩි දියුණු කිරීමට කටයුතු කර ඇත.  ආරක්ෂක අංශ සහයෝගය මත කිරි ගොවියන්ගේ අවතැන් වූ ගවයන් 55,000 ක් පමණ නැවත අයිතිකරුවන්ට ලබාදීමට පියවර ගෙන ඇත.

ඉදිරි වර්ෂ 05 ඇතුලත පළාතේ කිරි නිෂ්පාදනය දෙගුණ කිරීමට අපේක්ෂා කර ඇත. කිරි සැකසුම් මධ්‍යස්ථාන 09 ක්, ශීතකිරීමේ ඒකක 14 ක් සහ ගව ආහාර නිෂ්පාදන ආයතන 03 ක් ස්ථාපිත කිරීමටත්, ගොවියන්ට අවශ්‍ය උසස් වර්ගයේ ආනයන ගවයන් හා එළුවන් සැපැයීමටත්, කෘතිම සිංචන සේවා හා
ජංගම සත්ව සායන පවත්වා නව කිරි ගම්මාන ස්ථාපිත කර පළාතේ කිරි නිෂ්පාදනය ඉහළ දැමීමටද සැලසුම් කර ඇත.

**වාරිමාර්ග**

පළාතේ මධ්‍යම පරිමාණ වැව් 41 ක ඇළ මාර්ග වැඩි දියුණු කිරීමටත්, සුළු පරිමාණ වැව් පුනරුත්ථාපනය කිරීමටත්, කටයුතු කර ඇත.

ප්‍රදේශයේ වාරි පද්ධතිය වැඩි දියුණු කිරීම සඳහා පුනරුත්ථාපන ව්‍යාපෘතිය

යටතේ කුඩා වැව් 115 ක් 2008 වර්ෂයේදී පුනරුත්ථාපනය කිරීමට පියවර ගෙන ඇත.

**අධ්‍යාපනය**

පළාතේ අධ්‍යාපන ජාලය අධ්‍යාපන කළාප 13 කින් ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාල 44 කින් සහ පාසැල් 1,015 කින් සමන්විත වේ. මෙයින් පාසැල් 984 ක් පළාත් සභා පාසැල් වන අතර ජාතික පාසැල් 31 ක් වේ.

පාසැල් 441 ක් ද්‍රවිඩ පාසැල් වන අතර 298 මුස්ලිම් පාසැල් වෙ. 242 ක් සිංහල පාසැල් වේ. උගන්වන භාෂා මාධ්‍ය අනුව පාසැල් 716 ක් ද්‍රවිඩ මාධ්‍ය වන අතර පාසැල් 242 ක් සිංහල මාධ්‍ය වේ. පාසැල් 22 ක් ඉංග්‍රිසි මිශ්‍ර භාෂා මාධ්‍යයෙන් උගන්වනු ඇත. සමස්ථ ශිෂ්‍ය ප්‍රජාව 3,77,473 ක් වන අතර ගුරු සේවයේ හා විදුහල්පති සේවයේ 17,458 ක් නිරත වන අතර 2,272 ක් අනධ්‍යයන කාර්‍ය මණ්ඩලයකින් සමන්විතය.

2006/ 2007 වර්ෂ වල අළුතින් ගුරුවරුන් 2,241 ක් බඳවා ගත් අතර පාසැල් 07 ක් අළුතින් ආරම්භ කරන ලදි. රට අමතරව පාසැල් 40 ක් රළුග තත්ත්වයට උසස් කර ඇත.

2007 5 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි සිසුන් 23,273 ක් අතරින් සිසුන් 2,491 හට ශිෂ්‍යත්ව ලැබීමට සුදුසුකම් ලැබිණ. 2007 අ.පො.ස (උ.පෙළ) පෙනී සිටි සිසුන් 9,213 කි. ඉන් 60% ක් විශ්ව විද්‍යාලයට ප්‍රවේශ වීමට සමත් වී ඇත. රට සමානවම අ.පො.ස (සා.පෙළ) විභාගයේදී ද දස්කම් දක්වා ඇත. කාර්තිව් හා ත්‍රිකුණාමලය ප්‍රදේශයේ සිසුවියන් දෙදෙනෙකු දෙමළ මාධ්‍යයෙන් ජාතික මට්ටමේ පළවන හා පස්වන ස්ථාන ලබාගෙන ඇත.

**සෞඛ්‍ය**

මධ්‍යම රජය සහ පළාත් සභා සෞඛ්‍ය අමාත්‍යාංශය සමගාමීව වෛද්‍ය සේවා සැපැයීමට දායක වන අතර, රෝග නිවාරණ කටයුතු පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වගකීමකි. මේ සඳහා රාජ්‍ය ප්‍රතිපත්තියට එකඟව පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් පස් අවුරුදු සැලැස්මක් මත අදාල වැඩ සටහන ක්‍රියාත්මක කරනු ඇත.

නැගෙනහිර පළාත් සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මගින් මුළු පළාතම ආවරණය වන පරිදි සෞඛ්‍ය පහසුකම් ලබාදීමට කටයුතු කර ඇති අතර පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂක කාර්යාලය යටතේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාල 04 ක අධීක්ෂණය යටතේ සෞඛ්‍ය මධ්‍යස්ථාන 120 ක් ක්‍රියාත්මක වේ. නැගෙනහිර පළාතේ සෞඛ්‍ය සේවා කටයුතු නිතරම ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිවලට එකඟව මධ්‍යම රජයේ සහ පළාත් සභාවේ සහය මත සීමිත මූල්‍ය සහ මානව සම්පත් උපයෝගී කර ගනිමින් මෙම මට්ටමින් පවත්වා ගැනීමට හැකිවී ඇත.

## මාර්ග

මෙම පළාතේ මාර්ග ජාලය ඒ ශ්‍රේණියේ මහාමාර්ග, බී ශ්‍රේණියේ ප්‍රධාන මාර්ග, සී ශ්‍රේණියේ සුළු පරිමාණ මාර්ග, ඩී ශ්‍රේණියේ හා ඊ ශ්‍රේණියේ ග්‍රාමීය මාර්ගයන්ගෙන් සමන්විත වේ.

පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ වගකීම ඉහත සී සහ ඩී ශ්‍රේණිවලට අයත් මාර්ග නඩත්තු කිරීමයි. එම සී ශ්‍රේණියේ මාර්ග කි.මී. 1,066 ක් හා ඩී ශ්‍රේණියේ මාර්ග කි.මී.370 පමණ වේ. මෙම මාර්ග තත්ත්වයෙන් අවශ්‍යතාවයන්ට සරිලන සේ සකස් වී නොමැත. මෙම අවශ්‍යතාවය සපුරාදීම පළාත් මාර්ග සංවර්ධනයේ කාර්යය වේ.

කෙසේ වෙතත් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව සහ මාර්ග සංවර්ධන අධිකාරියේ සහයෝගයෙන් අත්‍යවශ්‍ය මාර්ග සහ පාලම් නඩත්තු කර ඇති අතර මාර්ග ජාලය රජයේ සහ විදේශ ආධාර යටතේ පුනරුත්ථාපනය කිරීමට කටයුතු කර ඇත.

## කර්මාන්ත

නැගෙනහිර පළාත් සභාව වෙත පවරා ඇති බලසීමාවන්ට අනුකූලව ප්‍රදේශයේ කර්මාන්ත හා ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. පළාතේ කර්මාන්ත දෙපාර්තමේන්තුව නැගෙනහිර ප්‍රජාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමට ඉවහල්වන කුඩා කර්මාන්ත වැඩිදියුණු කිරීමට අවශ්‍ය ණය පහසුකම්, වෙළෙඳපළ කළමණාකරණය හා තාක්ෂණික දැනුම හා නීති උපදෙස් ආදිය සපයමින් කර්මාන්ත නඟා සිටුවීමට උපකාරි කරනු ලැබේ.

2007 වර්ෂයේදී දිස්ත්‍රික් තුනෙන්ම විවිධ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ තුලින් තෝරාගත් තරුණයන් 962 කු සඳහා විවිධ කර්මාන්ත ක්ෂේත්‍රවල පුහුණුවක්

ලබාදුනි. මීට අමතරව ජාතික ශිල්ප සභාව අනුග්‍රහය යටතේ ද විවිධ අත්කම් නිර්මාණය සඳහා පුහුණුව ලබා දී ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීමට අවස්ථාව සලසා ඇත. මින් තෝරාගත් පිරිසකට වැඩිදුර පුහුණුව ලබා දීමට පියවර ගෙන ඇත.

## සමුපකාර සංවර්ධනය

ජනතා ව්‍යවසායකත්ව ආයතනයක් ලෙස සමුපකාරය නැගෙනහිර පළාතේ පුනරුත්ථාපන හා සංවර්ධන ක්‍රියාවලියේ ඉතා වැදගත් මෙහෙයක් ඉටු කරනු ලැබේ. යහපාලන වැඩපිළිවෙල ඔස්සේ සමුපකාර සහකාර කොමසාරිස් 4 දෙනෙකුගේ අධීක්ෂණය යටතේ සමුපකාර සමිති 996 ක් සහ විවිධසේවා සමුපකාර සමිති 44 ක් මගින් ජනතාවගේ අත්‍යවශ්‍ය සේවාවන් ඉටු කරනු ලැබේ.

ජාතික ප්‍රතිපත්තියට අනුව නැගෙනහිර පළාතේ සමුපකාර සහකාර කොමසාරිස් බලප්‍රදේශ නියෝජනය වන පරිදි සමුපකාර සුපිරි වෙළෙඳසැල් 28 ක් ආරම්භ කරන ලදි.

## පළාත් පාලනය

පළාත් පාලන කොමසාරිස්වරයකුගේ ප්‍රාදේශීය පළාත් පාලන සහකාර කොමසාරිස්වරුන් තිදෙනෙකුගේ අධීක්ෂණය යටතේ නැගෙනහිර පළාත් පාලන ආයතන 43 ක්‍රියාත්මක වේ. මින් ආයතන 02 ක් මහනගර සභාද, 04 ක් නගරසභාද, 37 ක් ප්‍රාදේශීය සභා වශයෙන් ද ක්‍රියාත්මක වේ.

පළාත් පාලන ආයතනය අදාල බලප්‍රදේශයේ සංවර්ධන ක්‍රියාවලියේදී වැදගත් මෙහෙයක් ඉටු කරනු ඇත. මේ සඳහා මධ්‍ය රජය මෙන්ම පළාත් සභාවෙද සහයෝගය ඇත. ග්‍රාමීය මාර්ග, පොදු වෙළෙඳසැල්, ග්‍රාමීය විදුලිය, ප්‍රජා ජල සම්පාදනය, ප්‍රජාශාලා, පෙර පාසල්, මාතෘ හා ළමා සායන වැනි ප්‍රජා අවශ්‍යතා සපුරා දීම සඳහා පළාත් පාලන ආයතන කටයුතු කරනු ලැබේ.

## සමාප්තිය

නැගෙනහිර පළාත් සභා මැතිවරණය සාර්ථකව අවසන් වී මෙම ප්‍රදේශයේ සිවිල් පරිපාලනය තහවුරු කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කිරීම තුලින් මතුවී ඇති ජාතික ගැටළුවට උචිත විසඳුමකට පියවර තැබීමක් වේ. එසේම මෙය

උතුරුකරයටද ප්‍රජාතන්ත්‍රවාදී අවසාන විසඳුමකට එළැඹීමට පිටුවහලක් වනු ඇත.

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභාවලට පැවරිය යුතු සම්පුර්ණ බලතල ක්‍රමානුකූලව පැවරීමට අතිගරු ජනාධිපතිතුමා අදහස් කර ඇත. එසේම පළාත් සභා පරිපාලන කටයුතු වලට පමණක් නොව ඒවායේ සංවර්ධන කටයුතු සඳහා මුල්‍ය ප්‍රතිපාදන සපයමින්, පළාත් පාලන ආයතන ශක්තිමත් කරමින් පළාත් සභා සංවර්ධන ක්‍රියාවලියේ වැදගත් යාන්ත්‍රනයක් බවට පත් කළ යුතුව ඇත.
අද අපට ප්‍රධාන අමාත්‍යවරයෙක් සිටියි. කලක් ඔහු එල්ටීටීඊ සංවිධානය සමඟ කටයුතු කර පසුව ප්‍රජාතන්ත්‍රවාදී මාවතකට පිවිස ජනතා සේවයට පත් වී ඇත. එසේම විවිධ දේශපාලන පක්ෂ නියෝජනය කරමින් තෝරාපත් කරගත් පළාත් සභාවක් නැගෙනහිර ජනතාවට ලැබී ඇත.

පසු ගිය වසර 17 ක කාලයක් තුළ තෝරාපත් පත් කර ගත් පළාත් සභාවක් නොතිබු බැවින් ආණ්ඩුකාරවරයාගේ මගපෙන්වීම යටතේ ප්‍රධාන ලේකම් හා අදාල අමාත්‍යාංශ ලේකම්වරුන් විසින් පළාත් අමාත්‍යාංශ ක්‍රියාත්මක කරන ලදි. එහෙත් දැන් එම තත්ත්වය වෙනස් වී ඇත. මේ වන විට හැකියාවක් ඇති හා කැප විය හැකි ප්‍රධාන අමාත්‍යවරයෙක් හා සෙසු විෂය අමාත්‍යවරුන් සිව් දෙනෙකුගෙන් සමන්විත පළාත් අමාත්‍ය මණ්ඩලයක් මෙම කටයුතු භාර ගැනීමට සුදානම් වී සිටිති. පළාතේ මහජන අවශ්‍යතාවයන් හා සංවර්ධනය කළ යුතු ප්‍රදේශ පිළිබඳව මනා අවබෝධයකින් ඔවුන් සිටින බැවින් මෙම අභියෝගයන් භාර ගෙන පසුගිය වසර කීපයේ ඉටු කිරීමට නොහැකි වු කටයුතු සියල්ල ඉටු කිරීමට හැකි වන බව මාගේ විශ්වාසයයි.

මේ සැම සභිකවරයකුගේම සිතේ තිබිය යුත්තේ එක අරමුණක් පමණි. එනම් වසර ගණනාවකට පසුව ස්ථාපිත වු මෙම ප්‍රජාතන්ත්‍රවාදී සභාවේ දායකත්වය දරමින් පසුගිය වසර කිහිපයකදී දැඩි පීඩාවට පත් මෙම පළාතේ ජනතාවට සේවයක් සලසමින් මෙම පළාත සංවර්ධනය කිරීමයි.

මෙම අභියෝග සියල්ලක්ම ජය ගන්නට අවස්ථාව ලැබේවායි ප්‍රධාන අමාත්‍යතුමාට, අමාත්‍ය මණ්ඩලය සහ සියළු සභික මහතුන්ට සහ මහත්මීන්ට මාගේ සුභ පැතුම් එක් කරමි.

ස්තුතියි,